# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1761/5 – 2012 ජුනි 06 වැනි බදාදා – 2012.06.06

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

යොමු අංකය: ඉප්‍රා/20/17/එල්.එල්.ඒ/26/2008.

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම, මෙයින් ප්‍රකාශ කරමි.

සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, ඉඹුල්පෙ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, උඩුවග්ගම් පත්තුව සුළු කොට්ඨාසයේ සීලෝගම (අ.ග.පි. 560) ගමේ පිහිටි සර්වේයර් ජනරාල්ගේ අංක ආර්/එස්එස්/අයිඑම්බී/2010/531 හා 2010 නොවැම්බර් මස 11 දිනැති ප්‍රගමන අනුරේඛනයේ කැබලි අක්ෂර 'ඒ' වශයෙන් සඳහන් ප්‍රමාණයෙන් හෙක්. 0.0478ක් පමණ වූ මුල්ලෙවත්ත නමැති පහත සඳහන් ඉඩම් කොටසට මායිම්:

උතුරට: ඩබ්. එම්. නිහාල් ප්‍රේමසිරි හිමිකම් කියන මුල්ලෙවත්ත හේන; නැගෙනහිරට: ඩබ්. එම්. නිහාල් ප්‍රේමසිරි සහ ඩබ්. ජී. පියදාස හිමිකම් කියන මුල්ලෙවත්ත හේන; දකුණට: මාර්ගය (මා.සං.අ.) සහ පඩිපෙල; බටහිරට: පඩිපෙල සහ ඩබ්. එම්. නිහාල් ප්‍රේමසිරි හිමිකම් කියන මුල්ලෙවත්ත හේන.

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය.

මගේ අංකය: එල්ඩී/05/2008/එච්ඩබ්/277.
2012 මැයි මස 29 වැනි දින.
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
"ගොවිජන මන්දිරය",
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

06 - 675



### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම, මෙයින් ප්‍රකාශ කරමි.

මධ්‍යම පළාතේ, නුවරඑළිය දිස්ත්‍රික්කයේ, වලපනේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, උඩ පළාත සුළු කොට්ඨාසයේ මන්ත්‍රිතැන්න ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක එන්යූ/ඩබ්එල්පී/2011/82 හා 2011 ජූලි මස 13 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සඳහන් ප්‍රමාණයෙන් හෙක්. 0.0184ක් පමණ වන පහත සඳහන් නම්වලින් හා ප්‍රමාණවලින් යුත් ඉඩම් කොටස්වලට මායිම්:

01. **කැබලි අක්ෂර 'ඒ' – මන්ත්‍රිතැන්න රජයේ ඉඩම – ප්‍රමාණය: හෙක්. 0.0100ක් පමණ**

උතුරට: මාර්ගය සහ අ.ග.පි. 228හි කැබලි අංක 342; නැගෙනහිරට: අ.ග.පි. 228හි කැබලි අංක 342 සහ කැබලි අක්ෂර බී; දකුණට: කැබලි අක්ෂර බී සහ අ.ග.පි. 228හි කැබලි අංක 342; බටහිරට: අ.ග.පි. 228හි කැබලි අංක 342 සහ මාර්ගය.

02. **කැබලි අක්ෂර 'බී' – මන්ත්‍රිතැන්න රජයේ ඉඩම – ප්‍රමාණය: හෙක්. 0.0084ක් පමණ**

උතුරට: කැබලි අක්ෂර ඒ සහ අ.ග.පි. 228හි කැබලි අක්ෂර 342;

නැගෙනහිරට සහ දකුණට: අ.ග.පි. 228හි කැබලි අංක 342; බටහිරට: අ.ග.පි. 228හි කැබලි අංක 342 සහ කැබලි අක්ෂර ඒ.

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය.

යොමු අංකය: 4/3/3/2010/ඩබ්ලිව්එස්/272.
2012 මාර්තු මස 22 වැනි දින.
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
"මිහිකත මැදුර", ඉඩම් මහලේකම් කාර්යාලය,
1200/6, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

06 - 676

---

## ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

### 5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලැබූ ඉඩම පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම, මෙයින් ප්‍රකාශ කරමි.

මහනුවර දිස්ත්‍රික්කයේ, කුණ්ඩසාලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, උඩගම්පහ කෝරළේ සුළු කොට්ඨාසයේ කෙන්ගල්ල ගමේ පිහිටි, මහනුවර කොට්ඨාස භාර මැනුම් අධිකාරි විසින් 2009 දෙසැම්බර් මස 10 වැනි දිනැතිව සකස් කර ඇති අංක මහ/කේඑන්ඩී/2009/266 දරන පූගමන අනුරේඛනයේ කැබලි අක්ෂර 'ඒ' වශයෙන් පෙන්නුම් කර ඇති ප්‍රමාණයෙන් හෙක්. 0.0635ක් පමණ වූ බලගොල්ල වත්ත නමැති පහත සඳහන් මායිම් තුළ පිහිටි ඉඩම් කොටස:

**01. කැබලි අක්ෂර 'ඒ' – බලගොල්ල වත්ත – ප්‍රමාණය: හෙක්. 0.0635ක් පමණ**

උතුරට, නැගෙනහිරට, දකුණට සහ බටහිරට: මු.පි.මහ 2712හි කැබලි අංක 69.

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය.

මගේ අංකය: එල්ඩී/05/2009/ඩබ්ලිව්එස්/117.
2011 සැප්තැම්බර් මස 13 වැනි දින.
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
"ගොවිජන මන්දිරය",
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

06 - 677

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.